පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල
විෂය - සිංහල
ශ්‍රේණිය - 7
පාඩම - 3 අක්ෂර මාලාව හා අක්ෂර වින්‍යාසය
03.iv

**සතිය 08**

**සතිපාසල පැවරුම**  **7 ශ්‍රේණිය**

**3 ඒකකය**

## සිංහල අක්ෂර මාලාව හා අක්ෂර වින්‍යාසය

**පහත සඳහන් පාඨයේ යෙදී ඇති මහප්‍රාණ අක්ෂර සහිත වචන ලියන්න.**

ප්‍රෞඪ ඉතිහාසයකට හිමිකම් කියන මේ ශ්‍රී ලංකාද්වීපයෙහි සතුරු ගනදුරු බිඳ හැර ධවල ජාත්‍ර නැංවූ ශ්‍රේෂ්ඨ නරපතියෙකු වූ වට්ටගාමිණී අභය මහ රජුගේ රාජ්‍ය සමයේ මාතලේ අලු ලෙනේදී මහා සංඝරත්නය විසින් ත්‍රිපිටක ධර්ම සංඝායනාවක් පවත්වා අඛණ්ඩව සුරක්ෂා කරගැනීම සඳහා ග්‍රන්ථාරූඪ කර තැබීම ශාසන ඉතිහාසයේ වඩාත් ප්‍රතිඵල දායක වූ සංසිද්ධියකි.

.........................................................................................................

................................................................................................................

**පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(i) අපේ පැරණිම ව්‍යාකරණ ග්‍රන්ථය කුමක්ද ?

..........................................................................................

(ii) එහි එන අක්ෂර මාලාවේ අකුරු ගණන කීයද ?

..........................................................................................

(iii) මහප්‍රාණ අකුරු හා ශ, ෂ, ස අකුරු ඇතුළත් හෝඩිය හඳුන්වන්නේ කවර නමකින්ද ?

..........................................................................................

(iv) එම අක්ෂර ගණන කීයද ?

..........................................................................................

**නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය තෝරන්න.**

(i) විශ්මය , විෂ්මය , විස්මය
(ii) නිශ්ශබ්ද , නිස්සබ්ද , නිෂ්ශබ්ද
(iii) විශේෂණ , විෂේශණ , විසේසන
(iv) ප්‍රස්තාර , ප්‍රශ්තාර , ප්‍රස්ථාර
(v) ආශ්වාද , ආෂ්වාද , ආස්වාද

**පහත දැක්වෙන ජේදවල අක්ෂර වින්‍යාස දෝෂ සහිත ස්ථාන නිවැරදි කර ලියන්න**

(i) කඩපොලට ගිය තාත්තා එනතුරු මම කඩුල්ල ලග බලා සිටියෙමි. ඒ ඔහු මට ටොපි දෙකක් රැගෙණ එනු ඇතැයි යන විශ්වාසයෙනි. අඳුර ගලා එද්දී ඈත අහසේ හඳ පායා එනු පෙනුණි.

(ii) භාශාවේ විශේශත්වයක් වන්නේ ලේඛණයට හා කතනයට බාවිත කල හැකිවීමයි. සිංහල බාෂාව සැලකූ විට එහි කතන ස්වරූඑයේ ලේඛණ ස්වරූපයට වඩා වෙනස්කම් පවතින බව පෙනේ.